# නැවතුණේ බෙහෙත් ගැනිල්ල නොව ටෙන්ඩරේ ඇරිල්ලයි

## - සෞඛ්‍ය අමාත්‍යාංශය

**නියමිත ටෙන්ඩර් පටිපාටිය අනුව කටයුතු කළත් තාක්ෂණික කරුණක් නිසා ටෙන්ඩරය විවෘත කිරීම පමණක් අද (18 වැනිදා) පෙරවරු 9.30 දක්වා කල් දැමූ බව සෞඛ්‍ය අමාත්‍යාංශය පවසයි.**

02 පිටුවට

## නැවතුණේ බෙහෙත්...

අමාත්‍යාංශය මේ බව පවසන්නේ 'නිලධාරීන්ගේ විරෝධයෙන් කෙහෙලියගේ බෙහෙත් ගැනිල්ල නවතී 'යන සිරස්තලය යටතේ පසුගිය 15 වැනිදා අප පත්‍රයේ පළ වූ පුවත සම්බන්ධයෙන් කරුණු පැහැදිලි කරමිනි.

එම කරුණු පැහැදිලි කිරීමේ ලිපියේ මෙසේ ද සඳහන් වෙයි.

අදාළ ඖෂධ මිල දී ගැනීම වෛද්‍ය සැපයුම් අංශයෙන් රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව වෙත ලබා දුන් ඇණවුමක් අනුව සිදු කිරීමට නියමිත වූ මිල දී ගැනීමකි. ඒ අනුව අදාළ ඖෂධ මිල දී ගැනීම නතර වී නොමැති අතර නියමිත ටෙන්ඩර් පටිපාටිය අනුගමනය කරමින් කටයුතු කර නියමිත වෙලාවට ටෙන්ඩරය වැසීම සිදු කර ඇති අතර විවෘත කිරීම සම්බන්ධයෙන් මතු වුණු තාක්ෂණික කරුණක් නිසා ටෙන්ඩරය විවෘත කිරීම පමණක් කල්දැමිණි.

ඒ අනුව මෙම ඖෂධ මිල දී ගැනීම වෛද්‍ය සැපයීම් අංශයේ අවශ්‍යතාව මත ඉදිරිපත් කරන ඇණවුමක් අනුව ඉදිරිපත් වූවක් වන අතර එය සෞඛ්‍ය ඇමැතිතුමාගේ මැදිහත්වීමෙන් හෝ උපදෙස් මත සිදුවූවක් නොවූ අතර එය නිලධාරීන්ගෙන් එල්ල වූ විරෝධතාවක් හේතුවෙන් නතර වීමක්ද සිදුව නොමැත.

මෙම ඖෂධ සැපයීම් සම්බන්ධයෙන් වෛද්‍ය සැපයීම් අංශයේ අධ්‍යක්ෂවරයා අවස්ථා කිහිපයකදීම සෞඛ්‍ය අමාත්‍යාංශයේ පැවති ප්‍රධාන පෙළේ සාකච්ඡා කිහිපයක දීම ඉල්ලීම් කර තිබේ. එසේ ඖෂධ සැපයීම නොකළහොත් මෙම ඖෂධවල උග්‍ර හිඟයක් රට තුළ ඇති වීමක් සිදු විය හැකි බව ද එහිදී වෛද්‍ය සැපයීම් අංශයේ අධ්‍යක්ෂවරයා පෙන්වා දෙනු ලැබීය.